බන්ධනාගාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ: 26/2015

මගේ අංකය :- බ12/08/වා.භා.ස/2015,
බන්ධනාගාර මූලස්ථානය,
2015-11-05.

සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීන්, සහකාර බන්ධනාගාර අධිකාරීන්

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ - 2015 වර්ෂය**

**2016 ජනවාරි 15 වන දිනට පෙර භෞතික සමීක්ෂණය සහ 2016 ජනවාරි 29 දිනට පෙර සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම.**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගේඅංක PFD/RED/03/03/01 හා 2014.10.17 දිනැති රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 02/2014 පරිදි වාර්ෂික ගබඩා භාණ්ඩ සමීක්ෂණය පහත පරිදි නිම කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

1. 2016.01.15 දිනට පෙර භෞතිකව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීම.
2. 2016.01.29 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීම .
3. 2016.02.17 දිනට පෙර ඌනතා හා අතිරික්ත සසඳා වාර්තා කිරීම.
4. 2016.02.26 දිනට පෙර විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරීම,අළුත්වැඩියා කළයුතු භාණ්ඩ අළුත්වැඩියාව හා වෙන්දේසි කළයුතු භාණ්ඩ වෙන්දේසි කර අවසන්කිරීම.
5. 2016.03.17 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට ද පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කිරීම සඳහා මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීම.
6. අපහරණය කරණ ලද වත්කම් තොරතුරු 2006.07.30 දින දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 422 අනුව ලේඛණගතකර එම වාර්තාව 2016 මාර්තු 31 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යකෂ ජනරාල් වරයා වෙත වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

මෙයට අමතරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති ලිපි හා චක්‍රලේඛ පිළිබඳව ද ඇඩි අවධානය යොමු කරණ මෙන් කාරුණිකව දන්වමි.

- දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ - 2008/54 - 2008-12-14
- දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ - 2008/57 - 2008-12-24
- දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ - 2008/58 - 2008-12-24
- දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ - 2008/59 - 2008-12-24
- ලිපි -බ12/08/වා.භා.ස.08 - 2008-12-04

තව ද ,

- 2015 වසර අවසන් වන තුරු නොසිට අදාල ආකෘතිපත්‍ර ලබාගෙන නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී නිම කළ හැකි සියළුම කටයුතු නිම කිරීමට අදාල උපදෙස් ලබාදෙන්න.සාමාන්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අමතරව කාර්මික හා කෘෂිකාර්මික අත්තිතාරම් ගිණුමට අදාලව භාණ්ඩ සමීක්ෂණයේදී ද භාණ්ඩාගාර 66 ආකෘතියේ සම්පූර්ණ කර තිබිය යුතුවේ. තව ද සුභසාධක ගිණුමට අදාලව ආකෘති වෙනම සකස් කළ යුතුවේ.
- පිටපත් 05 කින් සකස් කරණ ලද භාණ්ඩාගාර 66 ආකෘතිපත් වලින් එක් පිටපතක් බන්ධනාගාර කොමසාරිස්(මුදල්) වෙත 2015-12-12 වැනි දිනට පෙර යොමු කළ යුතු වේ.
- මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ යුතු ආකාරය දැක්වෙන, බන්ධනාගාර කොමසාරිස්(මුදල්) වෙතින් ලබාදෙනු ලබන අමතර ලිඛිත උපදෙස් අවශ්‍ය අවස්ථාවන් හිදී අදාල නිලධාරීන්ට ලබාදීමට කටයුතු කළ යුතු වේ.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

පිටපත්:- 01. විගණකාධිපති.

02. රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්.

එම්.බී.ආර්. පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.